**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ (MN-01) සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා**

**01 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2024**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණය (MN-01) සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා 01 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි 2024 වර්ෂයේ දී පැවැත්වීමට සැලසුම් කර ඇත.

**1 විභාග පරිපාටිය**

1.1 01 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණය (MN-01) සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා

1.1.1 **විභාගය පිළිබඳ විස්තරය:-**

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01.ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා කාර්යාල ක්‍රම | පැය 3 | 100 | 40% |
| 02.සමෘද්ධිසංවර්ධන පනත හා ජීවනෝපාය සංවර්ධනය සඳහා රජයේ ප්‍රතිපත්ති | පැය 3 | 100 | 40% |

1.1.2 විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය |
|---|---|---|
| 01. ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා කාර්යාල ක්‍රම | රජයේ කාරයාලවල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව,රාජකාරි ලිපි ලේඛන මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිළි හා සංක්ෂිප්ත සටහන් මඟින් තම අදහස්/නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව, කාර්යය පටිපාටික රීති,නියෝග හා ලිපියක් කෙටුම්පත් කිරීම.<br>කාර්ය පටිපාටික රීති හා ආයතන සංග්‍රහයේ VII, XII, XIV, XXIV පරිච්ඡේද පිළිබඳ දැනුම.<br>මු.රෙ. 119,<br>මු.රෙ.124 සිට 128 දක්වා<br>මු.රෙ. 133 හා 134<br>මු.රෙ.154 සිට 156 දක්වා<br>මු.රෙ.168,177,178 හා 343 | පැය 3 |
| 02. සමෘද්ධි සංවර්ධන පනත හා ජීවනෝපාය සංවර්ධනය සඳහා රජයේ ප්‍රතිපත්ති | සමෘද්ධි පනතේ සඳහන් විධිවිධාන, ප්‍රජාමූල බැංකු, ග්‍රාමීය සංවර්ධනය සඳහා දායකත්වය, ග්‍රාමීය සංවර්ධනය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන දෙපාර්තමේන්තු හා අනෙකුත් රාජ්‍ය ආයතනවල කාර්යභාරය. | පැය 3 |

**2 අයදුම්පත් ඉදිරිපත් කිරීම:**

මෙම පරීක්ෂණයට පෙනී සිටීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූලව A4 කඩදාසියක දෙපැත්තම භාවිතා කර සකස් කරන ලද අයදුම්පත් අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය සහිතව **2024.08.15 දින හෝ ඊට ප්‍රථම ඔබ සේවය කරනු ලබන දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ** වෙත යොමු කල යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ **"සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණයේ (MN-01) සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා 01 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය"** යනුවෙන් සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**3 විභාග ගාස්තු**

අසමත් විෂයන් සඳහා විභාගයට නැවත පෙනී සිටීමේදී එක් විෂයයකට රුපියල් දෙසිය පනහක් (රු.250/=) බැගින් විභාග ගාස්තු ලෙස ඔබ සේවය කරනු ලබන දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2003-02-99 ට බැර වනසේ ගෙවා එම කුවිතාන්සියේ පිටපතක් අයදුම්පත්‍රයේ අදාළ කොටසෙහි නොගැලවනසේ ඇලවිය යුතුය.

**4 විභාගයට පෙනී සිටීමට සුදුසුකම්:**

මෙම නිවේදනය සැලකිල්ලෙන් කියවා ඉල්ලා ඇති සියලුම තොරතුරු සම්පූර්ණ කර, අයදුම්පත් දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් වෙතොත් ඒවා ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

**5 විභාගයට ඇතුළත් කර ගැනීම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:**

අයදුම්පත් ඉදිරිපත් කර ඇති සුදුසුකම් සපුරා තිබෙන සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ඇත.

**6 විභාගයට පෙනී සිටීම සඳහා පැමිණීම වෙනුවෙන් ගමන් වියදම්, සංයුක්ත දීමනා හෝ උපවේශන දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.**

ආර්.ඩී.පී. වෙඩික්කාර
අධ්‍යක්ෂ (පාලන)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ (MN-01) සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා**

**01 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2024**

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම : (සිංහලෙන්) ....................................................................................................

1.2 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම : (ඉංග්‍රීසියෙන්) ....................................................................................................

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන්) ....................................................................................................

1.4 සම්පූර්ණ නම : (ඉංග්‍රීසියෙන්) ....................................................................................................

02. 2.1 තනතුර : ..................................................

03. 3.1 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : (සිංහලෙන්) ....................................................................................................

3.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය : (ඉංග්‍රීසියෙන්) ....................................................................................................

3.3 රාජකාරි ස්ථානය හා එහි ලිපිනය : ....................................................................................................

3.4 දුරකථන අංකය :

රාජකාරි: | | | | | | | | | | |   පෞද්ගලික: | | | | | | | | | | |

04. 4.1 ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | | | |

4.2 උපන් දිනය: | | | | |   | | |   | | |

4.3 ස්ත්‍රී පුරුෂ භාවය: |   |

05. 5.1 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : |   |

5.2 පෙනී සිටීමට බලාපොරොත්තු වන විභාගය : |   |

5.3 පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයය / විෂයයන්:

| | |
|---|---|
| | |
| | |

06. අයදුම්කරුගේ ප්‍රකාශය:

(අ) මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

(ආ) මෙම විභාගයට අදාළ සියළුම කොන්දේසි පිළිපැදීමට මම එකඟ වෙමි.

දිනය                                        අයදුම්කරුගේ අත්සන

07. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය:

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ඉහත අත්සන යෙදූ නිලධාරියා / නිලධාරිනිය මෙම දිස්ත්‍රික් කාර්යාලයේ/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරන බව සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය          දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ/ප්‍රාදේශීය ලේකම්/සහකාර අධ්‍යක්ෂ/වෙනත් බලයලත් නිලධාරි

(නිල මුද්‍රාව තබන්න)

08. දිස්ත්‍රික් ප්‍රධානියාගේ සහතිකය

(i) ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්,

(ii) අපේක්ෂකයා / අපේක්ෂිකාව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත් සහතික කරමි.

දිනය                                        දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ

| |
|---|
| මුද්දර ගෙවන ලද කුවිතාන්සිය අලවන්න |